**ශීර්ෂය 317 - උතුරු මැද පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2021 වර්ෂය.**

---

01. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

1.1 දැක්ම

පිරිපුන් පළාතක්

1.2 මෙහෙවර

ධරණීය සමමිතික සන සාර්ව සංවර්ධන ප්‍රවේශයකින් පළාත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ජාතික සංවර්ධනයට ඍජු හා අඛණ්ඩ ලෙස දායක වීම.

1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

02. මූල්‍ය ප්‍රකාශන

මුළු ප්රතිපාදන හා වියදම

2021 වර්ෂයේ දී උතුරු මැද පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රුපියල් මිලියන 25,488.75 ක් වූ අතර රුපියල් මිලියන 20,544.15 ක් වූ ශුද්ධ පුනරාවර්ථන ප්‍රතිපාදනයම සමාලෝචිත වර්ෂය අවසාන වන විට උපයෝජනය කර තිබුණු නමුත් රුපියල් මිලියන 4,944.6 ක් වූ ශුද්ධ මූලධන ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 1,758.6 ක් ඉතිරි කර තිබුණි. එකී ඉතිරිය ශුද්ධ මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 36 ක් විය. එසේම එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම | 2021.12.31 දිනට | | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 20,544.15 | 20,544.15 | - | - |
| මූලධන | 4,944.60 | 3,186.00 | 1,758.60 | 36 |
| එකතුව | 25,488.75 | 23,730.15 | 1,758.60 | 7 |

03. විගණන නිරීක්ෂණ

----------------------

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳව විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.